// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2071/13 – 2018 මැයි 15 වැනි අඟහරුවාදා – 2018.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයෙන් එම උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2018 ජූනි මස 05 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

ඒ. විමලවීර,<br>
සභාපති,<br>
බේකරි කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව.

2018 මැයි මස 14 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A – G27624 – 17 (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

බේකරි කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව විසින් ඇති කරනු ලදුව, වර්ෂ 1958 නොවැම්බර් මස 29 වැනි දින අංක 11605 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කළ වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2013 මාර්තු මස 27 දින අංක 1803/22 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයේ වෙනස් කරන ලද්දා වූ ද, තීරණ එම උපලේඛනයේ II වන කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| *සේවා වසර* | *ඒ පන්තිය*<br>*රු. ශත* | *බී පන්තිය*<br>*රු. ශත* | *සී පන්තිය*<br>*රු. ශත* |
|---|---|---|---|
| 1 වසර | 12,180.00 | 11,125.00 | 10,070.00 |
| 2 වසර | 12,330.00 | 11,250.00 | 10,170.00 |
| 3 වසර | 12,480.00 | 11,375.00 | 10,270.00 |
| 4 වසර | 12,630.00 | 11,500.00 | 10,370.00 |
| 5 වසර | 12,780.00 | 11,625.00 | 10,470.00 |
| 6 වසර | 12,930.00 | 11,750.00 | 10,570.00 |
| 7 වසර | 13,080.00 | 11,875.00 | 10,670.00 |
| 8 වසර | 13,230.00 | 12,000.00 | 10,770.00 |
| 9 වසර | 13,380.00 | 12,125.00 | 10,870.00 |
| 10 වසර | 13,530.00 | 12,250.00 | 10,970.00 |
| 11 වසර | 13,680.00 | 12,375.00 | 11,070.00 |

06 – 49/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වෙන විරෝධතාවයන් 2018 ජූනි මස 05 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

ඒ. විමලවීර,
සභාපති,
පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 මැයි මස 14 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1993.07.07 දින අංක 774/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයේ සඳහන් උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූද, කලින් කල වෙනස් කරන ලද්ද වූ ද, අවසන් වරට 2013 මැයි 31 වන දින 1812/30 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණවල II කොටස වෙනුවට පහත දැක්වෙන පරිදි නව කොටස ආදේශ වීමෙන්, තවදුරටත් වෙනස් කරනු ලැබේ. පවිත්‍රතා සේවා කර්මාන්තයෙහි නියුක්ත I වන තීරයෙහි සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වන තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

II කොටස

| I තීරය | II තීරය<br>වැඩ කරන සාමාන්‍ය දවසක් සඳහා වේතන ප්‍රමාණය<br>රු. ශත |
|---|---|
| (අ) ක්‍රියාකාරි සේවාවන්<br>පිරිසිදු කරන්නන්, සනීපාරක්ෂක කම්කරුවන්, ජැනිටර්ස් හෝ කිනම් නමකින් හැඳින්වුවද ආයතන හා කාර්යාල සුද්ද පවිත්‍ර කිරීමේ සේවාවන්හි යෙදෙන සේවකයින් | 500.00 |
| (ආ) පාලනමය සේවාවන්<br>ක්‍රියාකාරි සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයින්, කාර්යභාර සේවකයින්, සේවා මුර භාර සුපර්වයිසර්වරු හෝ සුපර්වයිසර්වරු | 700.00 |

06 – 49/2

---

**පඩිපාලක සභා ආඥා පනත**

නිවේදනයයි

**මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව යෝජනා කරන බව එකී පඩි පාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2018 ජූනි මස 05 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

ඒ. විමලවීර,
සභාපති.
මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 මැයි මස 14 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1947 පෙබරවාරි මස 14 වැනි දින අංක 9667 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්දා වූ සහ අවසන් වරට 2013 මාර්තු මස 07 වැනි දින අංක 1800/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පල වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

## II වැනි කොටස

## අවම මාසික වේතනය

## කම්කරුවාගේ පන්තිය

**ඒ පන්තියේ කම්කරුවෝ**

මගීන් 22කට වැඩියෙන් ගෙනයාමට අවසර ලත් බස්රථ රියදුරෝ.

**බී පන්තියේ කම්කරුවෝ**

මගීන් 22කට හෝ ඊට අඩු ගණනක් ගෙනයාමට අවසර ලත් බස්රථ රියදුරෝ, ගිලන් රථ රියදුරෝ හා හොණ්ඩර 20කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන් රථ රියැදුරෝ,

**සී පන්තියේ කම්කරුවෝ**

කුලී කාර් සහ කැබ් රථ රියැදුරෝ, හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන් රථ රියැදුරන්, ත්‍රීරෝද රථ රියැදුරන් හා මිනී රථ රියැදුරන්,

**ඩී පන්තියේ කම්කරුවෝ**

ප්‍රවාහන කාර්යයන් සඳහා යොදවනු ලබන ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ පදවන රියැදුරෝ හෝ ට්‍රේලර් සහිත ලොරි පදවන රියැදුරෝ (ස්කැමල් හෝස් වර්ගයේ ඒවා ඇතුළුව - එහෙත් වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ට්‍රේලර් සහිත ලොරි, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් හැර)

**ඊ පන්තියේ කම්කරුවෝ**

වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ පහත සඳහන් වන රථවල රියැදුරෝ, එනම් (අ) ලොරි සහ (ආ) ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ,

**එෆ් පන්තියේ කම්කරුවෝ**

බස්රථ වල නියුක්ත කොන්දොස්තරවරු, ලිපිකරුවෝ, කැෂියර්වරු, ප්‍රවේශපත්‍ර ලිපිකරුවෝ, ආසන වෙන් කරන ලිපිකරුවෝ.

**ජී පන්තියේ කම්කරුවෝ**

හොණ්ඩර 20කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරිවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

**එච් පන්තියේ කම්කරුවෝ**

හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරිවල සහ බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හා මිනී රථවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

**අයි පන්තියේ කම්කරුවෝ**

බස්රථ චෙකර්වරු හෝ වේලාව තබන්නෝ.

**ජේ පන්තියේ කම්කරුවෝ**

බස්රථ පරීක්ෂකවරු සහ නැවතුම්පලවල පරිපාලකවරු.

**කේ පන්තියේ කම්කරුවෝ**

මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි යෙදී සිටින එහෙත්, මෙහි ඉහත කොටස්වල සඳහන් නොවූ කම්කරුවෝ.

ඉහත සඳහන් තීරණවල -

(අ) ''ක්ලීනර්වරු'' යන්නෙන් ලොරි, බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මීනී රථ පිරිසිදුව තබා ගැනීමේ යොදවා සිටින (ලියකියවිලි වැඩෙහි නිරත සේවකයන් නොවන) කම්කරුවන් අදහස් කරනු ලැබේ.

(ආ) ''පෝටර්වරු'' යන්නෙන් ලොරි, බස් රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මීනී රථ යන මේවාට බඩු පැටවීමෙහි හෝ ඒවායේ බඩු බෑමෙහි යොදවා සිටින හා ඔවුන්ගේ වැඩ සම්බන්ධයෙන් ඒ රථවලම ගමන් කිරීමට සිදුවන කම්කරුවන් අදහස් කරනු ලැබේ.

## II වැනි කොටස

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| ආයතනයේ සේවා වර්ෂය | ඒ පන්තිය ඩී පන්තිය | බී පන්තිය | සී පන්තිය | ඊ පන්තිය එෆ් පන්තිය ජේ පන්තිය | ජී පන්තිය අයි පන්තිය | එච් පන්තිය | කේ පන්තිය |
|---|---|---|---|---|---|---|---|
| 1 වන වසර | 12,025.00 | 11,650.00 | 11,240.00 | 10,940.00 | 10,600.00 | 10,340.00 | 10,000.00 |
| 2 වන වසර | 12,225.00 | 11,825.00 | 11,390.00 | 11,065.00 | 10,700.00 | 10,440.00 | 10,100.00 |
| 3 වන වසර | 12,425.00 | 12,000.00 | 11,540.00 | 11,190.00 | 10,800.00 | 10,540.00 | 10,200.00 |
| 4 වන වසර | 12,625.00 | 12,175.00 | 11,690.00 | 11,315.00 | 10,900.00 | 10,640.00 | 10,300.00 |
| 5 වන වසර | 12,825.00 | 12,350.00 | 11,840.00 | 11,440.00 | 11,000.00 | 10,740.00 | 10,400.00 |
| 6 වන වසර | 13,025.00 | 12,525.00 | 11,990.00 | 11,565.00 | 11,100.00 | 10,840.00 | 10,500.00 |
| 7 වන වසර | 13,225.00 | 12,700.00 | 12,140.00 | 11,690.00 | 11,200.00 | 10,940.00 | 10,600.00 |
| 8 වන වසර | 13,425.00 | 12,875.00 | 12,290.00 | 11,815.00 | 11,300.00 | 11,040.00 | 10,700.00 |
| 9 වන වසර | 13,625.00 | 13,050.00 | 12,440.00 | 11,940.00 | 11,400.00 | 11,140.00 | 10,800.00 |
| 10 වන වසර | 13,825.00 | 13,225.00 | 12,590.00 | 12,065.00 | 11,500.00 | 11,240.00 | 10,900.00 |
| 11 වන වසර | 14,025.00 | 13,400.00 | 12,740.00 | 12,190.00 | 11,600.00 | 11,340.00 | 11,000.00 |
| 12 වන වසර | 14,225.00 | 13,575.00 | 12,890.00 | 12,315.00 | 11,700.00 | 11,440.00 | 11,100.00 |
| 13 වන වසර | 14,425.00 | 13,750.00 | 13,040.00 | 12,440.00 | 11,800.00 | 11,540.00 | 11,200.00 |
| 14 වන වසර | 14,625.00 | 13,925.00 | 13,190.00 | 12,565.00 | 11,900.00 | 11,640.00 | 11,300.00 |
| 15 වන වසර | 14,825.00 | 14,100.00 | 13,340.00 | 12,690.00 | 12,000.00 | 11,740.00 | 11,400.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ. .

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2018 ජුනි 05 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

ඒ. විමලවීර,
සභාපති,
ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව.

2018 මැයි මස 14 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව වර්ෂ 1978 අගෝස්තු මස 11 වැනි දින අංක 330 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූද, කලින් කලට වෙනස් කරන ලද්ද වූද, සහ අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද නිවේදනයේ උපලේඛනයෙන් වෙනස් කරන ලද්ද වූ තීරණවල 11 වන කොටස වෙනුවට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තවදුරටත් වෙනස් කළ යුතු ය.

(අ) ක්‍රියාකාරී සේවාවන්: ආරක්ෂක නිලධාරීන්, ආරක්ෂක භටයින්, මුරකරුවන්, පැට්රෝල්මන්, හෝ කිනම් නමින් හැඳින්වුවද ක්‍රියාකාරී සේවාවන්හි යෙදෙන සේවකයින්.

(ආ) පාලනමය සේවාවන්: ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයන්, කාර්යභාර නිලධාරීන්, මුර සේවා භාර සුපවයිසර්වරු හෝ සුපවයිසර්වරු.

අවම මාසික වේතනය

| සේවා වසර | ක්‍රියාකාරී සේවාවන් රු. ශත | පාලනමය සේවාවන් රු. ශත |
|---|---|---|
| 1 වන වසර | 10,000.00 | 10,620.00 |
| 2 වන වසර | 10,100.00 | 10,770.00 |
| 3 වන වසර | 10,200.00 | 10,920.00 |
| 4 වන වසර | 10,300.00 | 11,070.00 |

අවම මාසික වේතනය

| සේවා වසර | ක්‍රියාකාරී සේවාවන් රු. ශත | පාලනමය සේවාවන් රු. ශත |
|---|---|---|
| 5 වන වසර | 10,400.00 | 11,220.00 |
| 6 වන වසර | 10,500.00 | 11,370.00 |
| 7 වන වසර | 10,600.00 | 11,520.00 |
| 8 වන වසර | 10,700.00 | 11,670.00 |
| 9 වන වසර | 10,800.00 | 11,820.00 |
| 10 වන වසර | 10,900.00 | 11,970.00 |
| 11වන වසර | 11,000.00 | 12,120.00 |
| 12 වන වසර | 11,100.00 | 12,270.00 |
| 13 වන වසර | 11,200.00 | 12,420.00 |
| 14 වන වසර | 11,300.00 | 12,570.00 |
| 15 වන වසර | 11,400.00 | 12,720.00 |
| 16 වන වසර | 11,500.00 | 12,870.00 |
| 17 වන වසර | 11,600.00 | 13,020.00 |
| 18 වන වසර | 11,700.00 | 13,170.00 |
| 19 වන වසර | 11,800.00 | 13,320.00 |
| 20 වන වසර | 11,900.00 | 13,470.00 |
| 21 වන වසර | 12,000.00 | 13,620.00 |
| 22 වන වසර | 12,100.00 | 13,770.00 |
| 23 වන වසර | 12,200.00 | 13,920.00 |
| 24 වන වසර | 12,300.00 | 14,070.00 |
| 25 වන වසර | 12,400.00 | 14,220.00 |
| 26 වන වසර | 12,500.00 | 14,370.00 |

06-49/ 4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.